**චතාරික සමය හා බැඳි සාම්ප්‍රදායික පසන් ගායන ශෛලිය පිළිබඳ අධ්‍යයනයක්**

චතාරික සමය වූ කලී, කතෝලික සභාව විසින් හඳුන්වා දී ඇති ජන වන්දනා වසරට අයත් එක් කාල පරිච්ඡේදයකි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ දුඃඛප්‍රාප්තිය සිහිකිරීම උදෙසා අළු බදාදා සිට මහ සිකුරාදා දක්වා කාලය තුළ සබැඳි වත්පිළිවෙත් රාශියකි. කුඩා කණ්ඩායම් ඒකරාශි වී **පසන් ගැයීම** ඉන් එක් පිළිවෙතකි.

පසන් ආගමික චාරිත්‍රය ලාංකේය සමාජය තුළ ප්‍රතිෂ්ඨාපනය වූයේ කෙසේ ද ? එකී පසන් සංගීත ප්‍රකාශනයෙහි ප්‍රාදේශීය අනන්‍යතා ලක්ෂණ දැකිය හැකි වේ ද? එතුළින් ගම්‍ය වන සංගීත විශ්ලේෂණය සහ මානවවංශ සංගීතවේදී ස්වරූපය කවරාකාර ද ? පසන් ගීත තනුව සහ පදමාලාව කෙරෙහි එවක පැවති නාට්‍ය කලා හෝ සාහිත්‍යමය බලපෑම කෙබඳු ද ? පසන් ගායන ශෛලිය නූතනයේ කවර ආස්ථානයක් හිමිකර ගෙන තිබේ ද ? පසන් ආගමික චාරිත්‍රයේ ඇති සංස්කෘතික, සාමාජීය හා මනෝවිද්‍යාත්මක වැදගත්කම කුමක් ද? යන පර්යේෂණ ප්‍රශ්න මෙහි දී විශ්ලේෂණය කෙරෙයි. ඒ සඳහා යොදා ගැනෙන්නේ 'ගුණාත්මක පර්යේෂණ' විධික්‍රමයයි. 'අවශ්‍යතාව සඳහා නියැදීම' Judgement Sampling / Purposive Sampling අනුව ක්ෂේත්‍ර අධ්‍යයනය ප්‍රදේශ තුනක් තෝරා ගනිමින් මෙකී පසන් ගායන සම්ප්‍රදාය පිළිබඳ විමසා බැලේ. සහභාගිත්ව නිරීක්ෂණය, විධිමත් සහ අවිධිමත් සම්මුඛ සාකච්ඡා, පටිගත කිරීම, පසන් ගායන ශ්‍රවණය සහ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය මෙකී පර්යේෂණයේ දත්ත රැස්කිරීමේ විධික්‍රම වේ. මානවවංශ සංගීතවේදය ඇසුරින් න්‍යායික රාමුව සහ දත්ත විශ්ලේෂණය ප්‍රවේශ කිහිපයක් මෙහිලා යොදා ගැනෙයි.

පසන් සංගීත ප්‍රකාශනය අවස්ථාව, තනුව, රිද්මය - ලය, පද, ආකෘතිය, ගායන විලාසය සහ ගායන ප්‍රයෝග අනුව ප්‍රාදේශීය අන්‍යතතාවලින් යුක්ත ය. වෙරළබඩ කළාපයේ පසන් ගායනවලට වඩා රට අභ්‍යන්තර පසන් ගායන ශෛලියේ විශේෂතා පවතී. පසන් ප්‍රබන්ධ ලක්ෂණ විමසීමේ දී ඡන්දස්, විරිත් සහ භාෂා සංස්පර්ශීය ලක්ෂණ ද දැකිය හැකි වේ. එකී පසන් ජන නාට්‍ය, ජන සාහිත්‍ය ආභාසයෙන් පෝෂණය වූවකි. එමෙන් ම සාම්ප්‍රදායික පසන් ගීතවලට නවාංග එක් කිරීමෙන් පසන් ගායන පවත්වා ගෙන යන විවිධ කණ්ඩායම් තම අනන්‍යතා ගොඩ නංවාගැනීම සහ තහවුරු කිරීම සිදු කරයි. පසන් ගායනයේ නව ප්‍රවණතා රැසක් ද හඳුනාගත හැකි වේ. පසන් වැනි සමූහ ගායන ශෛලියක ඇති චිකිත්සක ස්වභාවය වටහා ගැනීම තුළින් ආධ්‍යාත්මික නිර්වින්දිතභාවය තුරන් කිරීමට ප්‍රතිකාරයක් ලෙස භාවිත කළ හැකි ය. එසේ කළ හැකි වන්නේ 'භාව විශෝධන' මාධ්‍යයක් ලෙස මෙවැනි ගායන සම්ප්‍රදායන් අධ්‍යයනය කිරීමෙනි. මෙය සිංහල සහ දෙමළ කතෝලික අන්තඃආගමික සංහිඳියාවක් ඇතිකිරීම සහ අන්තඃ සමාජ සමූහ අනුකලනය වැඩිදියුණු කිරීමේ ක්‍රමවේදයක් ලෙස යොදා ගත හැකි බව පෙනෙයි. පරිසරයට සහ මානව සමූහයාට ලැදි සමාජ දෘෂ්ටියක් සහ සමාජ ව්‍යූහයක් ගොඩනැගීමට එය රුකුලකි.

පසන් ගායනය සම්ප්‍රදාය සංගීත ශෛලියක් සහ සංස්කෘතිකාංගයක් ලෙස ශ්‍රී ලාංකේය කතෝලික සමාජයේ මුල් බැසගෙන තිබේ. එමඟින් චතාරික සමයේ අරමුණු හා සම්ප්‍රදාය සමාජගත වීම හා උපාර්ජනය සිදු වේ.

---

**ප්‍රමුඛ පද - පසන් ගීත, වැලපුම් ගායන, මානවවංශ සංගීතවේදය, දුඃඛප්‍රාප්තිය, චතාරිකය, ශ්‍රී ලාංකේය කතෝලික සංගීතය, මානවවංශ පර්යේෂණ**

Song of *Pasan,* Lamentations, Ethnomusicology, Passion of Christ, Lent, Catholic Music in Sri Lanka, Ethnographic Research